# ඇමෙරිකානු තානාපති කාර්යාලය, කොළඹ

## ඉංජිනේරු කාර්මික ශිල්පී (ගොඩනැගිලි ස්වයංක්‍රීය පද්ධති)
## (ගැහැණු / පිරිමි)

කොළඹ, ඇමෙරිකානු තානාපති කාර්යාලය විසින් සුදුසුකම්ලත් ඉංජිනේරු කාර්මික ශිල්පී (ගොඩනැගිලි ස්වයංක්‍රීය පද්ධති) තනතුරට අයදුම්පත් කැඳවනු ලැබේ.

**කාන්තා සහ පුරුෂ දෙපාර්ශවයම මෙම තනතුර සඳහා අයදුම් කරනු ඇතැයි අපේක්ෂා කරමු.**
**ඇමෙරිකානු තානාපති කාර්යාලය ජාතිය, වර්ණය, ආගම, ලිංග භේදය, ජාතිකත්ව සම්භවය, වයස, ආබාධිතභාවය, දේශපාලන පක්ෂපාතීත්වය, විවාහක/අවිවාහක බව හෝ ලිංගිකත්ව අභිමතය යන කරුණු නොසලකන අතර මානව විවිධත්ව ශ්‍රම බලකායක් යටතේ සමාන අවස්ථා වෙනුවෙන් කටයුතු කරනු ලබයි.**

ගොඩනැගිලි ස්වයංක්‍රීය පද්ධති ඉංජිනේරු තාක්ෂණ ශිල්පියා (BASET) ලෙස නව තානාපති කාර්යාල පරිශ්‍රයේ ස්ථාපිත පරිගණක හා මයික්‍රෝ ප්‍රොසෙසර් පාලන පද්ධතිවල ක්‍රියාකාරීත්වයන් හා නඩත්තු කටයුතුවල වගකීම දැරිය යුතු ය.

- **පූර්ණ කාලීන ව සතියකට පැය 40ක සේවා කාලයක් සහිත මෙම තනතුර සඳහා මාසික දළ වැටුප රු. 170,822/- කි.**

**සම්පූර්ණ කළ යුතු සුදුසුකම්:**

1. **අධ්‍යාපනය** - යාන්ත්‍රික/විදුලි/සාමාන්‍ය ඉංජිනේරු හෝ පරිගණකගත පද්ධති, පාලන හා සංවේදක තාක්ෂණ යන විෂය ක්ෂේත්‍රයක වසර හතරක (4) විද්‍යාවේදී උපාධියක් හෝ ඊට සමාන සුදුසුකම් සපුරා තිබිය යුතු ය. ***(අදාළ අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය).***
2. **පූර්ව රැකියා පළපුරුද්ද** - පරිගණක සහ මයික්‍රෝ ප්‍රොසෙසර්, පාලන පද්ධති ස්ථාපනය සහ වැඩසටහන්කරණය ඇතුළු ව ගොඩනැගිලි ස්වයංක්‍රීයකරන පද්ධතියක (BAS) ක්‍රියාකාරීත්වය හා නඩත්තුව පිළිබඳ අවම වශයෙන් වසර පහක (5) ක්ෂේත්‍ර පළපුරුද්දක් තිබිය යුතු ය. ***(අදාළ සේවා/ආයතනයේ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය). වැඩි විස්තර සඳහා අපගේ වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.***
3. **භාෂා ප්‍රවීණතාවය** - IV වන මට්ටමේ (ව්‍යක්ත ප්‍රවීණතාවයක්) ඉංග්‍රීසි භාෂාව කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ. ***(මෙය පරීක්ෂා කරනු ලැබේ)***. එසේම, IV වන මට්ටමේ (ව්‍යක්ත ප්‍රවීණතාවයක්) සිංහල සහ/හෝ දෙමළ කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ.
4. **නිපුණතා සහ හැකියාවන්** - මනා රිය ධාවන වාර්තාවක් සහිතව “B” පන්තියේ වලංගු රියදුරු බලපත්‍රයක් (කලින් C,C1 කාණ්ඩ) තිබිය යුතු වේ.
   *(රියදුරු බලපත්‍රයේ පිටපතක් අමුණා එවිය යුතු ය).*

**හෝ**

1. **අධ්‍යාපනය** - අ.පො.ස උසස් පෙළ සමත් වී තිබිය යුතු අතර (අවම වශයෙන් ප්‍රධාන විෂයයන් දෙකකට සාමාන්‍ය සාමාර්ථ දෙකක් තිබිය යුතු ය) අවම වශයෙන් අවුරුදු දෙකක (2) පූර්ණකාලීන විශ්ව විද්‍යාල/උසස් අධ්‍යාපනයක් ලබා තිබිය යුතු ය. ***(අදාළ අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය).***
2. **පූර්ව රැකියා පළපුරුද්ද** - පරිගණක හා මයික්‍රෝ ප්‍රොසෙසර්, පාලන පද්ධති ස්ථාපනය සහ වැඩසටහන්කරණය ඇතුළු ව ගොඩනැගිලි ස්වයංක්‍රීයකරන පද්ධතියක (BAS) ක්‍රියාකාරීත්වය හා නඩත්තුව පිළිබඳ අවම වශයෙන් අවුරුදු හතක (7) ක්ෂේත්‍ර පළපුරුද්දක් තිබිය යුතු ය. ***(අදාළ සේවා/ ආයතනයේ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය). වැඩි විස්තර සඳහා අපගේ වෙබ් අඩවියේ ඇති ඇබෑර්තු නිවේදනය බලන්න.***
3. **භාෂා ප්‍රවීණතාවය** - IV වන මට්ටමේ (ව්‍යක්ත ප්‍රවීණතාවයක්) ඉංග්‍රීසි භාෂාව කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ ***(මෙය පරීක්ෂා කරනු ලැබේ)***. එසේම IV වන මට්ටමේ (ව්‍යක්ත ප්‍රවීණතාවයක්) සිංහල සහ/හෝ දෙමළ කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ.
4. **නිපුණතා සහ හැකියාවන්** - මනා රිය ධාවන වාර්තාවක් සහිතව “B” පන්තියේ වලංගු රියදුරු බලපත්‍රයක් (කලින් C,C1 කාණ්ඩ) තිබිය යුතු වේ.
   *(රියදුරු බලපත්‍රයේ පිටපතක් අමුණා එවිය යුතු ය).*

**අයදුම් කරන ආකාරය :**

ඔබගේ අයදුම්පත් විද්‍යුත් බඳවා ගැනීමේ යෙදවුම් පද්ධතියක් [ERA] හරහා ඉදිරිපත් කිරීමට කරුණාකර අපගේ වෙබ් අඩවිය වන https://lk.usembassy.gov/embassy/jobs/ වෙත පිවිසෙන්න. ඔබ විසින් අදාළ අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අපගේ වෙබ් අඩවියේ සඳහන් කර ඇති උපදෙස් පරීක්ෂාකාරී ව කියවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**තැපැල් හෝ ඊමේල් මගින් එවනු ලබන අයදුම්පත් භාර ගනු නොලැබේ.**

ඔබගේ අයදුම්පත 2020 ජූලි 15 වන දින හෝ ඊට පෙර අප වෙත ලැබෙන්නට සලස්වන්න.
තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවන බව කාරුණිකව සලකන්න.